# භූගෝලීය තොරතුරු පද්ධතිය ආධාරයෙන් හඟුරන්කෙත ප්‍රදේශයේ පාංශු ඛාදනය අධ්‍යයනය කිරීම

**ඩී.එම්.එස්.එල්.බී. දිසානායක**


**සංක්ෂිප්තය**

ස්වාභාවික හෝ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මවු පස පිහිටි ස්ථානයෙන් වෙනත් ස්ථානයකට ගමන් කිරීම පාංශු ඛාදනය ලෙස සරළව අර්ථ දැක්විය හැකිය. පාංශු ඛාදනය ස්වාභාවික ක්‍රියාවලියක් වන අතර ඇතැම් මානව ක්‍රියාකාරීත්වයන් මෙම ස්වාභාවික ක්‍රියාවලිය වේගවත් කරනු ලබයි. පාංශු ඛාදනයෙන් යාන්ත්‍රික ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක හතරක් ඇති අතර ඒවා නම් ගලන ජලය, සුළඟ, සාගර තරංග හා අයිස් ය. සෞම්‍ය කලාපීය රටක් වන ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරික පාංශු ඛාදනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ලබන්නේ ගලන ජලයයි.

අධ්‍යයන ප්‍රදේශය ලෙස මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරාගෙන ඇති අතර එය ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයට ඇතුළත් ව.කි.මී. 229 භූමි භාගයකි. ඊට ග්‍රාම නිළධාරි කොට්ඨාස 264 අයත් වේ.

පාංශු ඛාදනයේ ස්වභාවය හා එහි තීව්‍රතාවය භූගෝලීය තොරතුරු පද්ධතිය ඇසුරින් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර මේ සඳහා භූමි පරිභෝජන රටාවන්, වර්ෂාපතනය, පාංශු සවිවරතාව, පසේ ස්වභාවය හා භූමියේ ආනතිය සහ අවකාශීය දත්ත යනාදිය බහුවිධ සමීක්ෂණ ක්‍රමය යටතේ (Multi Criteria Decision Mailing – MCDM) විශ්ලේෂණය කළ අතර අවසන් ප්‍රතිඵලය Google Earth හරහා ද්විපත පරීක්ෂණයට භාජනය කරන ලදි. එහිදී යොදාගත් දත්ත හා අධ්‍යයන ක්‍රමවේදය අනුව අධ්‍යයන ප්‍රදේශයෙන් 21% ක් අධික පාංශු ඛාදිත ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි අතර 58% ක භූමි ප්‍රමාණයක් මධ්‍ය ලෙස ඛාදිත ප්‍රදේශ ලෙස වාර්තා විය. අධ්‍යයන ප්‍රදේශය ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයෙහි පිහිටා ඇති නිසා මෙවන් පාංශු ඛාදිත ප්‍රතිඵලයක් වාර්තාවීමෙන් උද්ගත වන ජලාශවල රොන්මඩ තැන්පත් වීමේ ප්‍රශ්නයේ තීව්‍රතාවය මනාව විදහා පෙන්වනු ලබයි.


---

**යොමු වචන :-** පාංශු ඛාදනය: භූගෝලීය තොරතුරු පද්ධතිය, හගුරන්කෙත ප්‍රාදේශීය සභාව, පාංශු ඛාදිත ආකෘති